# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 306/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 20/02/2024

පැය 1225

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය**

2024.02.19 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකායේ සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කඩවත පොලිස් වසමේ මංකඩ පාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර 2024.02.16 වන දින මෝදර පොලිස් වසමේ ලෙල්ලම ප්‍රදේශයේ පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීමේ අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 200ක් සමග අත්අඩංගුවට ගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මොහු දැනට විදෙස් ගතව සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ සමීපතමයෙකු බවට තොරතුරු නිරීක්ෂණය වී ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**